Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# විෂය සමගාමී ක්‍රියාකාරකම් හා පාසල් ව්‍යාපෘති

# (මොඩියුල -අංක 10)




## ගුරු වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානය
## මිනුවන්ගොඩ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ශ්‍රී ලංකා ගුරු සේවය 2-II

# ගුරුභවතුන් වෙනුවෙන්

# සැකසුම අපේ අතින්

**මිනුවන්ගොඩ ගුරු වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානය**

W.K.C **කරුණාරත්න මිය - කළමනාකරු**

W.A.A **සුරංගනී මිය - කථිකාචාර්ය**

## දායකත්වයට අත්වැල් බැඳගත්තෝ

**ගම්පහ ගුරු වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානය**

H.H.B.M **කුමාරි මිය - කළමනාකරු**

M.A.M **රිෆ්දි මයා - කථිකාචාර්ය**

**(දෙමළ බසට පරිවර්තනය වෙනුවෙන්)**



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## මෙම මොඩියුලය ඔබට හඳුන්වාදීමේ අරමුණ හා අපේක්ෂිත ඵලය

## අරමුණ

ගුරුවරුන්ට පාසල තුළ ක්‍රියාත්මක කරනු ලබන විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ පුළුල් දැනුමක් ලබා දීම

## අපේක්ෂිත ඵලය

පාසලේ ඇති සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගත හැකි පරිදි පාසල තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සූදානම් වූ ගුරුවරුන් පිරිසක් ඇති කිරීම හා ඒ තුළින් මහා පෞරුෂ්‍යයකින් හෙබි දරු පරපුරක් බිහි කිරීම

## අන්තර්ගතය

පන්ති කමරය තුළ විභාග ඉලක්ක කරගත් විධිමත් විෂයමාලාවක් ක්‍රියාත්මක වේ.විධිමත් විෂයමාලාව තුළින් ලබා දෙන දැනුම ,ආකල්ප, කුසලතා ශක්තිමත් කිරීම සදහා පාසල විසින් මැනවින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන, නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලබන , විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳව මෙහි තොරතුරු ඇතුළත්ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# අන්තර්ගතය


1 විෂය සමගාමී ක්‍රියාකාරකම්

1-1 අධ්‍යාපනය හැඳින්වීම
1-2 විෂය සමගාමී ක්‍රියාකාරකම් හැඳින්වීම
1-3 විෂය සමගාමී ක්‍රියාකාරකම්වල අවශ්‍යතාව
1-4 විෂය සමගාමී ක්‍රියාකාරකම් තුළින් බලාපොරොත්තු වන ආකල්ප හා කුසලතා
1-5 විෂය සමගාමී ක්‍රියාකාරකම් අඩුවෙන් ක්‍රියාත්මක වීමට හේතු
1-6 පාසලක සංවිධානය කළ හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම්
1-7 විෂය සමගාමී ක්‍රියාකාරකම් වර්ගීකරණය
1-8 විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය තුළින් දරුවාට අත්වන වාසි
1-9 විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය තුළින් පාසලට අත්කර දිය හැකි වාසි
1-10 විෂය සමගාමී ක්‍රියාකාරකම් නිසි ලෙස ක්‍රියාත්මක නොවීම නිසා ඇති වන අහිතකර තත්ත්වයන්
1-11 විෂය සමගාමී ක්‍රියාකාරකම් නිසා ඇතිවන ශිෂ්‍ය සංවර්ධනයේ විවිධ අංග
1-12 විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානයේ දී අවධානය යොමු කළ යුතු කරුණු
1-13 විෂය සමගාමී ක්‍රියාකාරකම් නිසි ලෙස සංවිධානය කිරීම තුළින් අත්වන වාසි
1-14 විෂය සමගාමී ක්‍රියාකාරීත්වය සඳහා ඔබට දායකත්වය ලබා ගත හැකි පාර්ශවයන්
1-15 විෂය සමගාමී ක්‍රියාකාරකම්හි විදුහල්පති භූමිකාව
1-16 විෂය සමගාමී ක්‍රියාකාරකම්හි ගුරු භූමිකාව
1-17 ගැටලු නිරාකරණයට උපකාරී වන චක්‍රලේඛ

2 ව්‍යාපෘති

2-1 ව්‍යාපෘති හැඳින්වීම
2-2 ව්‍යාපෘතියක් මෙහෙයවන්නෙකු තුළ තිබිය යුතු කුසලතා
2-3 ව්‍යාපෘතියක් තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු
2-4 ව්‍යාපෘතියක අන්තර්ගත විය යුතු මූලික ලක්ෂණ
2-5 ව්‍යාපෘති තෝරා ගත හැකි ක්ෂේත්‍ර
2-6 විෂය ආශ්‍රිතව හෝ පාසල ආශ්‍රිතව තෝරා ගත හැකි ව්‍යාපෘති
2-7 ව්‍යාපෘති චක්‍රය
2-8 ව්‍යාපෘති යෝජනාව
2-9 ව්‍යාපෘති වාර්තාව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# විෂය සමගාමී ක්‍රියාකාරකම්
# (Co-curricular Activities)

**විෂය සමගාමී ක්‍රියාකාරකම් ශිෂ්‍යයාගේ අධ්‍යාපනය උදෙසා ඉවහල් වන ආකාරය ගැන ඔබට යම්අදහසක් තිබේද?මේ සදහා අපට අධ්‍යාපනය යනු කුමක්දැයි ප්‍රථමයෙන්ම සිතා බලන්න වෙනවා. අධ්‍යාපනය පිළිබඳ විද්වත් අදහස් කිහිපයක් ඔබ වෙත කැටි කරන්නම්.**

## 1-1 අධ්‍යාපනය යනු කුමක්ද යන්න අප පළමුවෙන්ම විමසා බලමු

**අධ්‍යාපනය යනු කුමක්ද? යන්න මොහොතක් සිතන්න. මෙයට පිළිතුරක් ඔබ සිතට නැගෙන්නට ඇත.**

**"අධ්‍යාපනයේ උත්තරීතර අගය නම් ගුණදහමින් යුත් හදවතක් ඇති පුද්ගලයෙකු තැනීමයි."**
**(කොන්පියුසියස්තුමා-**Confusius**)**

**"අධ්‍යාපනය යනු පූර්ණ මිනිසෙකු නිර්මාණය කිරීමයි"**
**(ආමොස් කොමේනියස්-**Amos Comenius**)**

"Education is the most powerful Weapon Which you can use to change the world."
(Abdul Kalam)

"Education is an all-round drawing out of the best in child and man."
(Gandhi)

Education is the process of facilitating learning by acquisition of Knowledge ,Skills,Values,morals and habits.

**එසේ නම් අධ්‍යාපනය යනු දැනුමට පමණක් කොටු නොවුණු පූර්ණ පෞරුෂයකින් හෙබි දරුවෙකු නිර්මාණය කිරීමේ ක්‍රියාවලියක් බව හා එය ඔවුන්ගේ අභ්‍යන්තරයේ ඇති දක්ෂතා ඉදිරියට ගෙනවිත් පෝෂණය කිරීම බව අපට වැටහෙනවා.**

**පහත දැක්වෙන කන්නගගර කමිටු වාර්තාවෙන්ද ඒ බව තහවුරු වෙනවා**

**"අධ්‍යාපනයේ ප්‍රජානන, කුසලතා සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගත හැකි ඒ 'සමගම බහුවිධ ජනසම්මතවාදී සමාජයකට ගැලපෙන ,අධ්‍යාත්මික ,සමාජයීය, සංස්කෘතික හා දේශපාලනමය සාරධර්ම ද ඇතුළත් වින්දන ක්ෂේත්‍රයන්හි අරමුණු ද සපුරා ගත හැකි මනාව සැලසුම් කළ විෂය සමගාමී ක්‍රියාකාරකම් හා අත්දැකීම් පාදක වූ සමබර විෂයමාලාවක් පාසල්වල ක්‍රියාත්මක විය යුතුය"**

**(1942 කන්නගගර කමිටු වාර්තාව)**

**මෙතෙක් දැක්වූ කරුණු කාරණා අනුව පාසල් පද්ධතිය තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම කෙතරම් වැදගත් ද යන්න ඔබ හදට දැනෙන්නට ඇති.**

- **පූර්ණ පෞරුෂ්‍යයෙන් යුතු දරුවෙකු බිහිකිරීමට**
- **පාසලට සමාජයට රටට හිතැති දරුවෙකු බිහි කිරීමට**
- **දරුවන් තුළ යහපත් ආකල්ප හා කුසලතා වර්ධනය කිරීමට**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- බුද්ධි වර්ධනය පමණක් අරමුණු නොකර පෞරුෂයේ සර්වාංශයීය වර්ධනයක් සිදු කිරීමට හැකි වීම .උදා- ශාරීරික ,මානසික ,සමාජයීය ,චිත්තවේග, සදාචාරමය, සෞන්දර්යාත්මක සංවර්ධනය

**මෙම වාර්තාවේ සදහන් සමබරිත විෂයමාලාව යනු කුමක්දැයි දැන් හඳුනා ගනිමු.**

ඔබ විසින් අධ්‍යාපනික අරමුණු ඉටුකර ගැනීමටත්, අධ්‍යාපනය ලබා දීමටත්, යොදා ගන්නා උපකරණය විෂයමාලාවයි.එමෙන්ම මේ තුළින් පිළිගත හැකි චර්‍යාවන් ඇතිකර පවත්වා ගෙන යාමටත්, නොපිළිගන්නා චර්යාවන් බැහැර කිරීමත් සිදු වේ.විෂයමාලාව යනු සිසුනට අධ්‍යාපනික අත්දැකීම් ලබාදීමට සකස් කරන ලද යාන්ත්‍රණයකි.

> "ඍජුව හෝ වක්‍රව පුද්ගලයෙකුගේ හැකියාවන් දිග හැරෙන සම්පූර්ණ හා පරිපූර්ණ පුද්ගලයෙකු කිරීමට ඍජුව හෝ වක්‍රව පාසල භාවිතාකරන පුහුණු අත්දැකීම් සමුදාය විෂයමාලාව නම් වේ."
>
> (ෆැරුන්ක්ලින් බොබිට්-1918)

> "අධ්‍යාපනික අරමුණු ඉටුකර ගැනීම සඳහා පාසල විසින් සැලසුම් කරන සියලු අත්දැකීම් විෂයමාලාවයි."
>
> (රුල්ෆ් ටයිලර්-1957)

ඒ අනුව අදහස් වන්නේ ,අප විසින් පන්ති කාමරයේ අධ්‍යාපන අරමුණු ඉටුකර ගැනීමට දැනුම ,ආකල්ප ,කුසලතා ලබා දීමට යොදා ගන්නා උපකරණය විෂයමාලාව බවයි. පූර්ණ ,සමබරිත විෂයමාලාවක් තුළින් සිසුනට විවිධ ක්ෂේත්‍ර ඔස්සේ අධ්‍යාපනික අත්දැකීම් ලබා දිය හැකි බව දැන් අපට වටහා ගතහැකියි.

ඔබගේ පාසලේ උගන්වනු ලබන සෑම විෂයකටම අමතරව සියලු විෂය සමගාමී කටයුතුද, පාසල් සම්ප්‍රදායන්ද, නීති-රීති හා පාසල් සංස්කෘතියද ඇතුළත් ශිෂ්‍ය චර්යා හැඩ ගැස්වීමට යොමු වන කාර්ය රාශියක එකතුව පූර්ණ විෂයමාලාවයි.




පූර්ණ විෂයමාලාව, මූලික වශයෙන්ම විධිමත් විෂයමාලාව හා අවිධිමත් විෂයමාලාව ලෙස දෙයාකාරයකින් හඳුනා ගත හැක.

- **විධිමත් විෂයමාලාව හඳුනා ගනිමු**

  විධිමත් විෂයමාලාව යනු අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශවලට අනුකූලව පාසලේ දියත් වන නිර්දේශිත විෂයමාලාවයි. ඔබ මෙය පාසලේ අවධියෙන් අවධියට වෙනස් වන බව හඳුනා ගෙනඇති.මෙය විෂය නිර්දේශ ,පෙළපොත් ගුරු අත්පොත් ඇසුරෙන් ක්‍රියාත්මක වේ .විධිමත් විෂයමාලාව ප්‍රධාන කොටස් 4 කට බෙදා අප පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වේ .

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

1 ප්‍රාථමික විෂයමාලාව [1-5 ශ්‍රේණි]
2 කනිෂ්ඨ ද්විතියික විෂයමාලාව [6-9 ශ්‍රේණි]
3 ජ්‍යෙෂ්ඨ ද්විතියික විෂයමාලාව [10-11 ශ්‍රේණි]
4 උසස් පෙළ විෂයමාලාව [12-13 ශ්‍රේණි]



- <u>අවිධිමත් විෂයමාලාව මෙසේ හඳුනා ගනිමු</u>


පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වාම කිසියම් විධිමත් ක්‍රමයකින් තොරව අහඹු ලෙස ලබන සියලු අත්දැකීම් අවිධිමත් අධ්‍යාපනයයි. අවිධිමත් විෂයමාලාව තුළින් ලබන අත්දැකීම් දරුවා තුළ කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමට ඔබට හැකියාව ලැබෙයි.





ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com

# පූර්ණ විෂයමාලාව




අවිධිමත් විෂයමාලාව විෂය සමගාමී විෂය මාලාව හා සැඟවුණු විෂයමාලාව ලෙස වර්ග කළ හැකිය.

- **<u>විෂය සමගාමී විෂයමාලාව</u>**

  විධිමත් විෂයමාලාව පෝෂණය කිරීම සඳහා පාසල විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළයි. මෙමගින් ශිෂ්‍යයාගේ දැනුම පමණක් නොව යහපත් ගති සිරිත්, යහපත් ආකල්ප ,උසස් කුසලතා හා පෞරුෂ්‍ය ලක්ෂණ වර්ධනය කිරීමට ඔබට හැකියාව ලැබෙයි. මෙම විෂය සමගාමී ක්‍රියාකාරකම් ලෙස ඔබේ පාසලේ ක්‍රියාත්මක වන ශිෂ්‍ය සමිති ,බාලදක්ෂ කණ්ඩායම් දැක්විය හැක.

- **<u>සැඟවුණු විෂයමාලාව</u>**

  ජාතික අරමුණුවලට අනුකූලව විධිමත් හා අවිධිමත්ව සිසුවෙකුගේ අනාගත හැදියාවනට සරිලන පරිදි පාසල තුළදී ප්‍රගුණ කළයුතු ආචාරශීලී හා ආගමට අදාළ නිපුණතා ප්‍රගුණ කර වීම සැඟවුණු විෂයමාලාව තුළින් සිදු කෙරේ.
  උදා- ඔබේ පාසලේ උදය රැස්වීම, පාසලේ පිරියත, පාසලේ විනය

**විෂය සමගාමී**
Co-curriculum

- ක්‍රීඩා
- සමිති
- බාලදක්ෂ

**සැඟවුණු**
Hidden Curriculum

- පාසල් ගීතයට අවනත වීම
- සීනුවට අවනත වීම




**1-2 විෂය සමගාමී ක්‍රියාකාරකම් යනු කුමක්ද යන්න අප දැන් විමසා බලමු.**

ඔබ පත්වීම් ලැබ පාසලට ගියදා පටන් ඔබේ දරුවන්ට විෂය සමගාමී ක්‍රියාකාරකම් රැසක් සිදු කරන්නට ඇති.අපි ඒ බව හොඳාකාරව දනිමු. නමුත් ඔබ මොහොතකටවත් විෂය සමගාමී ක්‍රියාකාරකම් කියන්නේ මොනවටද යන්න සිතුවාද?

01 "විධිමත් විෂයමාලාව පෝෂණය කිරීම සඳහා පාසල විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් සමූහයක එකතුවකි"

02 "දැනුම පමණක් නොව යහපත් ගතිසිරිත්, යහපත් ආකල්ප ,උසස් කුසලතා හා පෞරුෂ ලක්ෂණ වර්ධනය කරනු ලබන ක්‍රියාකාරකම් සමූහයක්"

03 "සාම්ප්‍රදායානුකූල පන්ති කාමර ඉගැන්වීම් ක්‍රියාකාරකම් වලින් එක්තරා ප්‍රමාණයකට වෙනස් වූ පරිපාලනමය නැඹුරුවකින් හා සංවිධානාත්මක ස්වරූපයකින් යුතු පාසල මගින් ක්‍රියාත්මක කරනු ලබන සියලු ක්‍රියාකාරකම්"

[Dictionary of Education-New York]

04 "පාසල තුළදී හෝ පිටතදී කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව ගුරුවරුන් ඇතිව හෝ නැතිව සපුරා ගත හැකි සේ පාසල මගින් සැලසුම් කර මෙහෙයවනු ලබන සියලු අත්දැකීම්ය"

[J. F .කර් 1988 ]

05 "Co-curricular activities are defined as activities that enable to supplement & complement the curricular (main syllabi) activities."

[Merrium Webster Dictionary]

දැන් ඔබ ඔබේම නිර්වචනයක් සකසා ගන්න.

මට හිතුණ දේ




ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
iskolee.com

## ගුරුවරයකු වන ඔබගේ වගකීම ත්‍රිවිධාකාරයි

01 සිය රැකියාවට සම්බන්ධ රෙගුලාසි රීති හා නීත්‍යානුකූල උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමේ වගකීම

02 ශිෂ්‍යයන්ට පුළුවන් තරම් ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමේ සදාචාරාත්මක වගකීම

03 ශිෂ්‍යයන් අනතුරු වලට භාජනය වීම වළක්වාලීම සඳහා තමන් විසින් ඉටු කළයුතු සියලුම සාධාරණීය කාර්යයන් ඉටු කිරීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

එසේ නම් ගුරු වෘත්තියෙහි නියැලෙන ඔබේ යුතුකම ගුණ නැණයෙන් යුතු දරුවන් සමාජයට දායාද කිරීමයි.ඒ සඳහා ගුණාත්මක වූ අධ්‍යාපනයක් අප දරුවන්ට ලබ ාදිය යුතුය.

**ගුණාත්මක අධ්‍යාපනය**

↓

**දැනුම + ආකල්ප + කුසලතා**

↓

**විෂය සමගාමී ක්‍රියාකාරකම්**

↓

**නීතිරීතිවලට අනුගත විය යුතුය**

↓

**දරුවන්ගේ ආරක්ෂාවට ප්‍රමුඛතාව ලබාදිය යුතුය**

## 1-4 විෂය සමගාමී වැඩසටහන් පාසල් තුළ ක්‍රියාත්මක වීම තුළින් බලාපොරොත්තු වන ආකල්ප හා කුසලතා මොනවාද බලමු

- **ආකල්ප** (Attitudes)

1 ජාතියට පාසලට ආගමට භක්තිය හා ගෞරවය දැක්වීමට

2 ක්‍රමවත් බව ,ක්‍රමානුකූල බව ,නීතිගරුක බව හා විනය ගරුක බව

3 ඉවසීම ,ජය පරාජය සතුටින් බාර ගැනීම

4 අන්‍ය මත ඉවසීම ,සංවේදී බව මානව දයාව වර්ධනය

5 අභියෝගවලට නොබියව මුහුණ දීම



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

6 ධෛර්යවන්ත බව

7 පොදු දේපළ ආරක්ෂාව

8 පරිසරයට හිතකාමී බව

9 වින්දනාත්මක බව

10 සංවර බව

11 කරුණාවන්තකම වර්ධනය

- **කුසලතා** (Skills)

1 සංවිධානාත්මක ශක්තිය වර්ධනය

2 ඉදිරිපත්වීමේ කුසලතා

3 සන්නිවේදන කුසලතා

4 කථිකත්වය

5 බුද්ධි වර්ධනය

6 නර්තන හැකියාව

7 රැස්වීම් සැලසුම් කිරීම

8 නිර්මාණකරණය




**1-5 විෂය සමගාමී ක්‍රියාකාරකම් පාසල තුළ අඩුවෙන් ක්‍රියාත්මක වීමට හේතු බලපා ඇති හේතු ලෙස ඔබට සිතෙන්නේ මොනවාද?**

- විභාග කේන්ද්‍රිය අධ්‍යාපන ක්‍රමය
- ටියුෂන් කරා සිසුන්ගේ ඇදීයාම
- විධිමත් විෂයමාලාවට වැඩි අවධානය
- ප්‍රවාහන සේවයේ ගැටලු
- ගුරුවරුන්ගේ ආකල්ප හා ගැටලු
- දෙමාපිය ආකල්ප

## 1-6 පාසලක සංවිධානය කළ හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් කිහිපයක්



1 ක්‍රීඩා - අන්තර් නිවාස ක්‍රීඩා තරඟ

වොලිබොල්

පාපන්දු

දැල්පන්දු

ක්‍රිකට්

හොකී

2 ශිෂ්‍ය සංගම් - සාහිත්‍ය සංගම්

විද්‍යා සංගම්

ගණිත සංගම්

බෞද්ධ සංගම්

දැනුම මිනුම සංගම්



3 ආගමික වැඩසටහන් - ශීල ව්‍යාපාර

ධර්ම දේශනා

භක්ති ගීත

වෙසක් උත්සව

පොසොන් උත්සව




4 උදෑසන රැස්වීම - විශේෂ උදෑසන රැස්වීම

අංශ මට්ටමේ රැස්වීම

පන්ති මට්ටමේ රැස්වීම

Iskolee.com

5 සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් - විවිධ ප්‍රසංග

චිත්‍ර ප්‍රදර්ශන

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

නාට්‍ය ප්‍රසංග

කලා උළෙල

6 ශිෂ්‍ය සුබසාධනය - සෞඛ්‍යදාන

රතුකුරුස




7 බාලදක්ෂ /පෝතක ,බාල දක්ෂිකා/කුඩාමිතුරි

8 බිත්ති පුවත්පත්

9 ව්‍යාපෘති - අධ්‍යාපන චාරිකා

ක්ෂේත්‍ර චාරිකා

ශ්‍රමදාන

ඔබ පාසලේ පවතින මානව හා භෞතික සම්පත් අනුව පාසලට ගැලපෙන ආකාරයට එම ක්‍රියාකාරකම් සංවිධානය කර ගැනීමට ඔබ වගබලා ගත යුතුය, එමෙන්ම චක්‍රලේඛවලට අනුගත විය යුතු අතර, එම ක්‍රියාකාරකම් දියත් කිරීමට පෙර විදුහල්පති ඇතුළු අදාළ නිලධාරීන්ගේ අනුමැති ලිපිය ලබා ගත යුතුය,




**1-7 විෂය සමගාමී ක්‍රියාකාරකම් මෙසේ වර්ග කරමු**

1 පාසල තුළ පමණක්

උදෑසන රැස්වීම

ශිෂ්‍ය සමිති

සඟරා

බිත්ති පුවත්පත්



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ප්‍රථමාධාර ඒකක

භාෂා දින

## 2 පාසල හා ප්‍රජාව




ශ්‍රමදාන ,ආගමික උත්සව

ක්‍රීඩා කටයුතු

ත්‍යාග ප්‍රදානෝත්සව

සෞඛ්‍ය වැඩසටහන්

## 3 පාසල හා රජයේ ආයතන සම්බන්ධ



පාසල් සෞඛ්‍ය වැඩසටහන්

පරිසර හට කණ්ඩායම්- මධ්‍යම පරිසර අධිකාරිය

මාර්ග ආරක්ෂාව - ශ්‍රී ලංකා පොලිසිය

දැනුම මිනුම තරඟ - රාජ්‍ය බැංකු

විවාද තරඟ - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

රූපවාහිනි හා ගුවන්විදුලි වැඩසටහන්

## 4 පාසල හා රජයේ නොවන

මත්ද්‍රව්‍ය නිවාරණය-ADIC - සෞඛ්‍ය අමාත්‍යාංශය

පරිසර වැඩසටහන්-World Vision

මානව හිමිකම් පිළිබද දැනුවත් කිරීම - මානව හිමිකම් සංවිධානය

නව නිපැයුම් තරගාවලී

## 1-8 ඔබේ පාසල තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම තුළින් ඔබේ දරුවන්ට අත්වන වාසි

1 සිය විවේක කාලය අර්ථවත්ව ගත කිරීමට හැකියාව ලැබේ.

2 තම දක්ෂකම් හඳුනා ගෙන කුසලතා වර්ධනය කර ගැනීමට හැකියාව ලැබේ.

3 සිතීමේ හා මතක ශක්තිය වැඩි දියුණු වේ.

4 අන් මතයන්ට ගරු කිරීමට පුරුදු වේ.

5 පරිසරයට හිතැති සමාජයට ගැලපෙන දරුවෙකු නිර්මාණය වේ.

## 1-9 ඔබේ පාසල තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ඔබ දියත් කළොත් එමගින් ඔබේ පාසලට අත් කර දිය හැකි වාසි







**ඵල**

- පාසල ප්‍රජාව අතර ජනප්‍රිය වීම
- පාසලේ සංවිධාන ශක්තිය වර්ධනය වීම
- පාසලට ඇති ඉල්ලුම වැඩිවීම
  - විනය ගරුක සමාජයක් පාසල තුළ මෙන්ම ප්‍රජාව තුළ බිහි වීම
- ගුරු මණ්ඩලය අතර සහයෝගය වර්ධනය වීම
  - ගුරු සිසු සබඳතා වර්ධනය වීම

## 1-10 ඔබේ පාසලේ විෂය සමගාමී ක්‍රියාකාරකම් නිසි ලෙස පාසල තුළ ක්‍රියාත්මක නොවුණහොත් ඇති වන අහිතකර තත්ත්වයන්

- ආවේගකාරී දරු පිරිසක් බිහිවීම
- පාසල තුළ විනය ගැටලු ඇතිවීම
- පාසලේ කීර්ති නාමයට හානිවීම



## 1-11 විෂය සමගාමී ක්‍රියාකාරකම් නිසා ඇතිවන ශිෂ්‍ය සංවර්ධනයේ විවිධ අංග



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 1-12 ඔබ පාසල තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධාන කිරීමේ දී පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය

1 අරමුණ හඳුනා ගැනීම

2 ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම

3 අවශ්‍යතා ලේඛනයක් ඉදිරිපත් කිරීම

4 ප්‍රතිපාදන ලබා ගැනීම

5 වාර්ෂික ලිතට යොමු කිරීම

## 1-13 ඔබ විෂය සමගාමී ක්‍රියාකාරකම් නිසි ලෙස සංවිධානය කිරීම තුළින් අත් වන වාසි

1 කාලයෙන් උපරිම ඵලනෙළා ගැනීමට හැකි වීම

2 දරුවන් විනය ගරුකව හැසිරීමට පුරුදු වීම

3 බාහිර සමාජය තුළ ඇගයීමට ලක් වීම

4 සංවිධානාත්මකව යමක් කිරීමේ අත්දැකීම දරුවන්ට ලබා ගත හැකිවීම

## 1-14 විෂය සමගාමී ක්‍රියාකාරිත්වය සඳහා දායකත්වය ලබා ගත හැකි පාර්ශව

- විදුහල්පති/නියෝජ්‍ය විදුහල්පති
- ගුරුවරු
- ශිෂ්‍ය ශිෂ්‍යාවන්
- දෙමාපියන්
- ආදි ශිෂ්‍ය ප්‍රජාව
- පාසල අවට ප්‍රජාව

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 1-15 විෂය සමගාමී ක්‍රියාකාරකම්හි විදුහල්පතිගේ භූමිකාව



විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානයේ දී විදුහල්පති භූමිකාව ඉතා වැදගත්ය. උපරිම මට්ටමේ විෂය සමගාමී ක්‍රියාකාරකම් රැසකට සම්බන්ධවීමට අවශ්‍ය පහසුකම් දරුවන්ට ලබා දියහැකි වන්නේ විදුහල්පතිගේ දක්ෂතාව මතය.

### මෙහිදී විදුහල්පතිතුමා සතු විය යුතු නිපුණතා




### 1 සංකල්පමය නිපුණතා

- නව යෞවනත්වයත් සමග දරුවන් තුළ ඇතිවන ආවේගයන් මැඩ පැවැත්වීමේ උපාය මාර්ගයන් ලෙස විෂය සමගාමී ක්‍රියාකාරකම්වල වැදගත්කම හඳුනාගත හැකි වීම .
- විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී භාවිතා කළ හැකි උපාය මාර්ගයන්හි වෙනස්වීම් හඳුනා ගත හැකි වීම .

### 2 අකල්පමය නිපුණතා

- විෂය සමගාමී ක්‍රියාකාරකම් කෙරෙහි ධනාත්මක දෘෂ්ටි කෝණයකින් යුක්ත වීම .
- ඒ සඳහා සහභාගී වන දරුවන් තම පාසලේ කීර්ති නාමයට රුකුලක් වන පිරිසක් බව අවබෝධ කර ගැනීම .

### 3 මානව නිපුණතා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට දායකත්වය ලබා දෙන ගුරුවරුන් නිතර දිරි ගැන්වීම .
- ගුරුවරුන්ගේ දක්ෂතා හා රුචි අරුචිකම් හඳුනා ගෙන ඔවුන්ට විෂය සමගාමී ක්‍රියාකාරකම්වල වගකීම පැවරීම .

### 4 තාක්ෂණ නිපුණතා

- අවම වශයෙන් එක් දරුවෙකු විෂය සමගාමී ක්‍රියාකාරකම් දෙකකටවත් යොමු කිරීමට දක්ෂ වීම .
- සිසුන් මෙන්ම  දරුවන් විෂය සමගාමී ක්‍රියාකාරකම් හමුවේ දක්වන දක්ෂතාව  අගය කිරීම සඳහා ක්‍රියාමාර්ග සම්පාදනය කිරීම .

## 1-16 විෂය සමගාමී ක්‍රියාකාරකම්හි ගුරුවරයාගේ භූමිකාව

ඔබ සෑම විටම විෂය සමගාමී ක්‍රියාකාරකම්හි දරුවන් නිරත කරවීම සඳහා උනන්දු විය යුතු අතර ඔවුන්ගේ දක්ෂතා හැකි සෑම විටම අගය කළ යුතුය.




**විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවර්ධනය සඳහා ඔබ සතු විය යුතු නිපුණතා**



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 1 සංකල්පමය නිපුණතා

- දරුවන්ගේ පූර්ණ පෞරුෂත්‍වය සංවර්ධනය සඳහා විෂය සමගාමී වැඩසටහන් අමිල මෙහෙවරක් සපයන බව වටහා ගැනීම.
- විෂය සමගාමී ක්‍රියාකාරකම් මෙහෙයවන ගුරුවරුන් නිරන්තරයෙන් මනා සුහද සබඳතාවක් පවත්වා ගැනීම.

## 2 ආකල්පමය නිපුණතා

- විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳව ධනාත්මක ආකල්පයකින් යුක්ත වීම
- සිසුන්ගේ අනාගතය උදෙසා විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට පූර්ණ දායකත්වය හදවතින්ම ලබාදීම.

## 3 මානව නිපුණතා

- විෂය සමගාමී ක්‍රියාකාරකම් හි නායකත්වය භාර ගෙන දරුවන්ට නිසි මඟ පෙන්වීම ලබා දීම.
- විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් සිය සහෝදර ආචාර්ය මණ්ඩලයේ සහයෝගය වර්ධනය වන අයුරින් කටයුතු කිරීම.

## 4 තාක්ෂණික නිපුණතා

- විෂය සමගාමී ක්‍රියාකාරකම්හි නිරත වන දරුවන්ගේ හැකියා-දක්ෂතා මධ්‍යස්ථව නිරීක්ෂණය කිරීම.
- පාසල තුළ මෙන්ම පාසලෙන් පරිබාහිර ව සංවිධානය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා පාසල් කළමනාකාරීත්වයට උපරිම දායකත්වය ලබා දීම .



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**1-17 පාසල්වල විෂය සමගාමී කටයුතු ක්‍රියාත්මක කිරීමේදී මතු වන ගැටලු නිරාකරණය කර ගැනීමට ගුරුවරුන්ට උපකාරී වන චක්‍රලේඛ:**

ළමයින් විෂය සමගාමී ක්‍රියාකරකම්වල නිරත කරවීමේ දී, ඔබට විවිධාකාර ගැටලුවලට මුහුණ දීමට සිදු වී ඇති බව නොඅනුමානයි.එයට හේතුව ඔබගේ සීමා මායිම් වලින් පිට පැනීමට දරුවන්ට නිදහසක් විෂය සමගාමී ක්‍රියාකාරකම් වලදී ලැබෙන නිසයි.එබැවින් ඔබගේ නිසි අධීක්ෂණය සෑම විටම ක්‍රියාත්මක විය යුතුය.එසේ නොවුණු අවස්ථා අපගේ පාසල් පද්ධතිය තුළ ඉතා භයංකාර සිදුවීම් බවට පරිවර්තනය වූ අවස්ථා මේ අවස්ථාවේ ඔබේ සිහියට නැගෙනු ඇතැයි සිතමු.

උදා-

1 සිද්ධිය

"පාසල් වත්තේ ගසක අත්තක් කපන්නට ගසට යැවූ ශිෂ්‍යයාට විදුලි සැර වැදී ආබාධිත වූ වගයි"

2 සිද්ධිය




"පාසල් වත්තේ ගසක් කඩා වැටී ශිෂ්‍යයෙක් මාරාන්තික තුවාල ලබයි. "

3 සිද්ධිය

"ගුරුවරුන් සමඟ ක්ෂේත්‍ර චාරිකාවකට ගිය පාසල් සිසුන් තිදෙනෙකු මහවැලි ගඟේ ගිලී මිය යයි. "

4 සිද්ධිය

"පාඨශාලාන්තර ක්‍රීඩා තරඟ සඳහා ගුරුවරුන් සමඟ දුම්රියෙන් ගිය ළමුන් තිදෙනෙක් අනතුරකට භාජනය වෙයි."

එසේ නම් අප දරුවන්ගේ ආරක්ෂාව ගැන මීට වඩා සිතිය යුතු බව මෙම සිද්ධීන් වලින් ඔබට සිතෙන්නට ඇති.ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු බැවින් අපේ රටේ වලංගු නීතිය ගැන දැන සිටිය යුතුය.ඔබ දරුවන්ට දැනුම ලබා දීමට වඩා සෑම අවස්ථාවකදීම ආරක්ෂාවට මුල් තැන දිය යුතුය. එසේ නොවුණහොත් සුපරීක්ෂාකාරී නොවීමේ වරදට ඔබ හසු වී නීතියෙන් වරදකරුවෙකු බවට පත්වීමට සිදුවෙනු ඇත. එසේ නම් විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී ඔබ චක්‍රලේඛ පිළිබඳ ව සුළු වශයෙන් හෝ දැනුවත් වී සිටීම ඔබට වැදගත් වනු ඇත,

## 1 පාසල් වල දුම්පානය, මත්පැන් භාවිතය, මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව

උදා- ක්‍රීඩා උත්සව වලදී සිසුන් මත්පැන් පානය කළ අවස්ථාවක දී

1995/01/31 දින දරණ අංක 1995/06 චක්‍රලේඛ

අප මැනවින් විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය නොකළොත් නව යොවුන් වියේ පසුවන කණ්ඩායම් එකතු වී දුම්පානය කිරීම් ,මත්පැන් පානය කිරීම් වැනි අකටයුතුකම් කර නව අත්දැකීම් ලබන්නට දරුවන් මෙවැනි අවස්ථා ප්‍රයෝජනයට ගනී.එවැනි අවස්ථා මතු නොවීමටත් මතු වුවහොත් අවශ්‍ය පියවර ගැනීමටත් වලංගු නීති පිළිබඳ සරල අවබෝධයක් හෝ ඔබ සතුව තිබිය යුතුය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- පාසල් භූමිය තුළ පාසල් උත්සව අවස්ථාවන්හි දී දුම්පානය හා සුරාව සම්පූර්ණයෙන්ම තහනම් කළ යුතුය.
- ගුරුවරුන් හා විදුහලේ වෙනත් සේවකයින් හෝ පාසලට එන දෙමාපිය වැඩිහිටි ආදීන්ට පාසල් භූමිය තුළදී දුම්පානය හා මත්පැන් පානය සම්පූර්ණයෙන්ම තහනම්ය.
- දුම්වැටි හා මත්පැන් පාසල් දරුවන් ලවා ගෙන්වා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය.

## 2 ළමයින්ට ශාරීරික දඬුවම් පැමිණ වීම පිළිබදව සම්පූර්ණයෙන්ම තහනම් කිරීම

❖ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 2001/11 යටතේ 2001/03/20 නිකුත් කළ චක්ලේඛය

❖ මෙහි ඔබට වැදගත් කරුණු කිහිපයක් නම් ,
මෙහි සිසුවෙකුට කායිකව හෝ මානසිකව හිංසාවට ලක් නොකළ යුතුයයි සදහන්ය.

ශාරීරික වශයෙන් දඬුවම් දීමෙන් වැළකී විකල්ප ක්‍රියාමාර්ග ගතයුතු බව තහවුරු කර ඇත .

- අවවාද කිරීම
- දෙමාපියන්ට / භාරකරුවන්ට භාර දීම
- ශිෂ්‍යයා මෙතෙක් භුක්ති විදි වරප්‍රසාද සීමා කිරීම
- බරපතල ක්‍රියාවක් කළහොත් දෙමාපියන්ට දන්වා සති 2කට නොවැඩි කාලයක් පංති තහනම් කිරීම
- ඉතා බරපතල විනය විරෝධී ක්‍රියාවක් කර ඇත්නම්, එහි බරපතල කම අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පූර්ව අනුමැතිය ඇතිව සති 2කට වැඩි කාලයක් පන්ති තහනම් කිරීම හෝ වෙනත් පාසලකට එම දරුවා මාරු කිරීම
- අවසන් තීරණ දෙකම ගත යුත්තේ විනය මණ්ඩලයක් කැඳවා නිසි පරීක්ෂණයක් කිරීමෙන් අනතුරුවය




## 3 පාසල් ළමයින් ප්‍රසිද්ධ උත්සව වලට සහභාගී කරවීම හා පාසල් තූර්යවාදක කණ්ඩායම් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධව

❖ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 1985/10 යටතේ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් නිකුත් කළ අංක 2/ක්‍රීඩා/3/13 හා 1975/12/30 දරණ චක්‍රලේඛය

❖ නොයෙකුත් උත්සව වලට පැමිණෙන අමුත්තන් පිළිගැනීම සදහා පාසල් ළමයින් මඟ දෙපස පෙළ ගැස්සවීම ,ආචාර පෙළපාලි පැවැත්වීම හා පාසල් භූමියෙන් පිටතදී පාසල් තූර්ය වාදක කණ්ඩායම් පාවිච්චි කිරීම සපුරා තහනම්ය.

❖ පාසල් ළමුන් ප්‍රසිද්ධ උත්සව වලට සහභාගී කළ යුත්තේ පහත සදහන් අවස්ථා වලදී පමණී.

- පාසල් උත්සව
- අධ්‍යාපන අමාත්‍යාංශය මගින් හෝ ප්‍රාදේශිය අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් හෝ සංවිධානය කරනු ලබන අධ්‍යාපනික උත්සව



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- ජාතික දින උත්සව
- අතිගරු ජනාධිපති උතුමාණන් හෝ ගරු අගමැතිතුමා සහභාගි වන උත්සව
- විද්‍යශීය රාජ්‍ය නායකයන් සහභාගී වන උත්සව

එසේ නම් ගුරුවරයකු වන ඔබ කිසිවිටක මෙම නියමයන් උල්ලංඝනය නොකිරීමට වග බලා ගත යුතුය.

**ඔබේ දරුවන් ඇස්**
**මායිමේ රදවා**
**ගන්න**




**¿ඊලැශ**
**මඩලු?ශඹිස**
**ශ(ශ9ශ@ශ9**
**ෂ9ශ**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 2 පාසල් ව්‍යාපෘති

# SCHOOL PROJECTS











## 2-1 පළමුව ව්‍යාපෘතිය යනු කුමක්දැයි හඳුනා ගනිමු

"ව්‍යාපෘතියක් යනු තෝරාගත් අරමුණු කිහිපයක් ඉටු කර ගැනීම සඳහා පිරිවැය ,කාලය හා ගුණය ආදි කරුණු සලකා බලමින් ක්‍රියාත්මක වනු ලබන ආරම්භයක් සහ අවසානයක් ඇති කාර්යයකි"

(මැරියන් ඊ හේන්ස්-Marian E Haynes)

එනම් කිසියම් කාර්යයන් සමූහයක් ව්‍යාපෘතියක් වශයෙන් හැඳින්විය හැක,

## 2-2 පාසල තුළ ව්‍යාපෘතියක් මෙහෙයවන ඔබ තුළ තිබිය යුතු කුසලතා

- ආරම්භයේ සිට අවසානය දක්වා ව්‍යාපෘතිය මැනවින් සංවිධානය කිරීමට හැකිවීම
- විවිධ බාධකවලට මුහුණ දෙමින් ඉදිරියට යා හැකි සැලසුමක් පිළියෙළ කිරීමේ හැකියාව
- ව්‍යාපෘති සැලසුම ක්‍රියාත්මක කිරීමේදී අන් අයගේ සහය ලබා ගැනීමේ හැකියාව
- සැලසුම් කළ ව්‍යාපෘතිය කුමන බාධක මත හෝ ක්‍රියාත්මක කිරීමේ හැකියාව

## 2-3 ව්‍යාපෘතියක් තෝරා ගැනීමේ දී සැලකිය යුතු කරුණු

- එය තමාට හෝ තම පාසලට සම්බන්ධ ගැටලුවක් වීම.
- එම ගැටලුව තමාට හා තම කණ්ඩායමට එකතුව ක්‍රියාකාරීව විසඳීමේ හැකියාවෙන් යුක්ත වීම.
- ව්‍යාපෘතිය දියත් කිරීමෙන් තමාට හෝ තම පාසලට යහපතක් සැලසීම.

## 2-4 ඔබ විසින් පාසල සම්බන්ධ කර ගෙන කරන්නා වූ ව්‍යාපෘතියක අන්තර්ගත විය යුතු මූලික ලක්ෂණ 04 කි

01 සාධනය කර ගත හැකි ඵලදායි අරමුණක් හෝ අරමුණු රාශියක් තිබීම.

02 එම අරමුණු සාධනය සඳහා සැලසුම් සහගත අනුක්‍රමික ක්‍රියාකාරකම් සහිත වැඩපිළිවෙළක් වීම.

03 නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ එම වැඩසටහන නිම කළ හැකිවීම.

04 ව්‍යාපෘතියක ඵලදායිතාවය ඇගයීමට ලක් කළ හැකි වීම.

## 2-5 ඔබට පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ ව්‍යාපෘති තෝරා ගත හැක

01 ගවේෂණය - හෙළිදරව් කර ගැනීම සහ අනාවරණයක් සඳහා

02 සමීක්ෂණය - ගැටලුවක් පිළිබඳ තොරතුරු රැස් කර නිගමන හා නිර්දේශයන්ට එළඹීමට

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03 ප්‍රජා සංවර්ධනය - ප්‍රජා සංවර්ධනයට සුභසාධනයට හේතු වන ක්‍රියාකාරකම් සංවිධානයට

04 සිද්ධි අධ්‍යයනය - යම් සුවිශේෂී සිද්ධියක් ,ගැටලුවක් පිළිබඳව තොරතුරු ක්‍රමවත්ව අධ්‍යයනය කිරීමට

05 ගැටලු නිරාකරණය - සමාජීය , විද්‍යාත්මක හෝ ආයතනික ගැටලුවක් පිළිබඳව

06 නිෂ්පාදන ආකෘති ගොඩ නැංවීම- උදා : ඇන්තුරියම් වගාව

07 නවීකරණය - දැනට පවතින නිෂ්පාදනයකට නව අංග එකතු කිරීමට

08 නව නිෂ්පාදන සොයා ගැනීම්- මෙතෙක් භාවිතයේ නොමැති යම් මෙවලමක් නිපදවීමට

09 නිර්මාණය /ගොඩ නැංවීම - යම් වස්තුවක් නිර්මාණය (බිත්ති සැරසිලි)

10 සංදර්ශන/ප්‍රදර්ශන- උදා ක්‍රීඩා සංදර්ශන







**2-6 ඔබ පාසල තුළ ව්‍යාපෘතියක් තෝරා ගන්නා විට එය විෂය ආශ්‍රතව හෝ පාසල ආශ්‍රිතව තෝරා ගත හැක.**

| විෂය ආශ්‍රිත ව්‍යාපෘති | පාසල ආශ්‍රිත ව්‍යාපෘති |
|---|---|
| සාහිත්‍ය විෂය සඳහා සඟරාවක් නිර්මාණය කිරීම | ඔසු උයනක් නිර්මාණය කිරීම |
| විද්‍යා සංගමයක් පිහිටුවා ගැනීම | පෝෂණ වැඩසටහනක් ලෙස කැඳ දරුවන්ට ලබාදීම |
| බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීම | බිත්ති ආශ්‍රිතව ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම |
| අඩු සාධන මට්ටමක් ඇති දරුවන්ගේ සාධන මට්ටම වැඩි කිරීම | දෙමාපිය ආකල්ප සංවර්ධන වැඩසටහනක් දියත් කිරීම |
| ගණිත විෂය සඳහා ඉගෙනුම් ආධාරක එකතුවක ' සකස් කිරීම | ගුරුවරුන් සඳහා නව ඉගෙනුම් ක්‍රම හඳුන්වා දීම |
| ප්‍රායෝගික තාක්ෂණ විෂය සඳහා ප්‍රදර්ශනයක් පැවැත්වීම | පාසලෙන් ගිලිහී යන්නන්සඳහා වෘත්තිය පුහුණුව පිළිබඳ දැනුවත් කිරීම |

**2-7 ව්‍යාපෘති පිළබඳ අදහස් දක්වන විද්වතුන් ව්‍යාපෘති චක්‍රයක් පිළිබඳව අදහස් දක්වා තිබේ.**





## 1 අවශ්‍යතා විශ්ලේෂණය

යම් ගැටලුවක් විසඳීම හෝ අවශ්‍යතාවක් ඉටු කර ගැනීම ඉලක්ක කර ගෙන යම් ව්‍යාපෘතියක් බිහි වේ.එයට අදාළ සියලු තොරතුරු සියල්ල විශ්ලේෂණය කර බලා අවශ්‍යතාව හඳුනා ගැනීම පළමුවෙන්ම කළ යුතුය.දැනට පවතින තත්ත්වය හා අපේක්ෂිත තත්ත්වය අතර පරතරය අවශ්‍යතාව ලෙස විග්‍රහ කර ඇත..ඔබට සමීප අත්දැකීමක් ඇසුරෙන් සිතමු. ඔබේ පාසලට පුස්තකාලයක් නැතැයි සිතමු.

අපේක්ෂිත තත්ත්වය

පුස්තකාලයක් ඇති කිරීම



පරතරය

පුස්තකාලයක් ඇති කිරීමේ අවශ්‍යතාව

දැනට පවතින තත්ත්වය

පුස්තකාලයක් නොමැත

ඔබට ඔබේ පාසලේ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා පහත සඳහන් ශිල්ප ක්‍රම භාවිතා කළ හැක.

- නිරීක්ෂණය
- සාකච්ඡා
- ප්‍රශ්නාවලි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

මෙසේ අවශ්‍යතාව හඳුනා ගැනීමේ දී අවශ්‍යතා එකක් හෝ රාශියක් තිබෙන බව ඔබට පෙනී යනු ඇත.ගැටලු රාශියක් ඇත්නම් එම ගැටලු අතුරින් එකක් තෝරා ගැනීම සඳහා අවශ්‍යතා ප්‍රමුඛ ගත කොට එනම් අවශ්‍යතාවල වැදගත්කම අනුව පෙළගස්වා ප්‍රථම අවශ්‍යතාව ව්‍යාපෘතිය සඳහා තෝරා ගත යුතුය.

## 2 ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘතිය තෝරා ගත් පසු එය නිර්වචනය කර ගැනිම සහ එහි පරමාර්ථ, අරමුණු පැහැදිලි කරගැනීම වැදගත්ය.

පරමාර්ථ

බප/ මිහිඳු විද්‍යාලයේ දරුවන් සඳහා
කියවීමේ රුචිය වර්ධනය කිරීම සඳහා
පුස්තකාලයක් ඉදි කිරීම

අරමුණු

එම අරමුණු ලිවීමේ දී පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් විය යුතුය.

| | |
|---|---|
| Specific | - සුවිශේෂී විය යුතුය |
| Measurable | - මැනිය හැකි වීම |
| Achievable | - සාධනය කර ගත හැකිවීම |
| Relevant | - අදාළ විය යුතුය |
| Timebound | - කාල සීමාව දැක්විය යුතුය |

ඔබ අරමුණක් ලිවීමේ දී ඉහත සඳහන් කරුණුවලට අමතරව පහත සඳහන් කොන්දේසි වලට යටත් විය යුතු බව සිහි තබාගන්න.

1 කුමක්ද? -ව්‍යාපෘතියක් ඉටු කිරීමේ අපේක්ෂිත කාර්ය
2 කාටද? -ඉලක්ක කණ්ඩායම
3 කොහේද? -ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ස්ථානය
4 කවදාද? -ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාල රාමුව
5 කොපමණද? -ව්‍යාපෘතිය අවසානයේදී අපේක්ෂිත ප්‍රමාණය


බප/මිහිඳු විද්‍යාලයේ සිසුන් සියදෙනකු
වෙනුවෙන් මෙම වර්ෂය තුළදී අඩි
100*අඩි 50 පුස්තකාල
ගොඩනැගිල්ලක් ඉදිකිරීම

- කුමක්ද? -පුසුතකාලයක්
- කාටද? -සිසුන් 100
- කොහේද?-මිහිඳු විද්‍යාලය
- කවදාද? -වර්ෂය තුළ
- කොපමණද-100*50 ගොඩනැගිල්ල

දැන් ඔබට අරමුණු ලිවීම පිළිබඳ අවබෝධයක් ලැබෙන්නට ඇති.එම නිසා ඔබ පාසල පිළිබඳව ඇති ගැටලුවලට අදාළවන පරමාර්ථ හා අරමුණු ලිවීමට උත්සහ කරන්න


## 3 ව්‍යාපෘති යෝග්‍යතාව පිරික්සීම

ව්‍යාපෘතිය මූල්‍ය සාධක මත හෝ වෙනත් සාධක මත වැදගත්ද යන්න විමසීම මෙහිදී ඔබ විසින් සිදුකළ යුතුය.එය ක්‍රියාත්මක කිරීමෙන් ඵලක් වේයයි හැඟී ගියොත් පමණක් එය ඉදිරියට කර ගෙන යා යුතුය .




### මූල්‍යමය නොවන අංශය

ගුරුවෘත්තියෙහි නියැලෙන ඔබට බොහෝ විට ඔබ පාසලේ දියත් කිරීමට සිදු වන්නේ මෙම ගණයේ ව්‍යාපෘතිය. යම් ව්‍යාපෘතියක් කිරීමට පෙර එය කිරීම තුළින් අධ්‍යාපනික ඵල ප්‍රයෝජන ලැබේද, එනම් දරුවන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට ඉවහල් වේද? ගුරුවරුන්ගේ ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ වේද ආදී වශයෙන් මැන බැලිය යුතුය. එමෙන්ම එය සංස්කෘතියට ගැළපේද? පරසරයට හිතකරද ?එය ක්‍රියාත්මක කළහොත් නීතිමය වශයෙන් ' ගැටලුවක් ඇති නොවේද? අවශ්‍ය තාක්ෂණික දැනුම සපයා ගත හැකිද? එමෙන්ම එම ව්‍යාපෘතිය කල්පවත්නා එකක්ද? යනුවෙන් සිතා බැලිය යුතුය.




### මූල්‍යමය අංශය

ඔබ තෝරා ගත් 'ව්‍යාපෘතිය මූල්‍යමය වටිනාකමකින් යුක්ත එකක් නම් ඒසදහා සුදුසු ක්‍රමවේදයක් තෝරා ගෙන මූල්‍යමය ප්‍රතිලාභ පිළිබඳ සලකා බැලීම වැදගත්ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 4 ව්‍යාපෘති සැලසුම සැකසීම


මෙම අවස්ථාව වන විට ඔබ ගොඩ නගාගත් ව්‍යාපෘති සැලැස්ම ලිඛිත ලේඛනයක් බවට පත් කළ යුතුය.ව්‍යාපෘතියක් යනු ක්‍රියාකාරකම් රැසක එකතුවක් බැවින් එයට අදාළ ක්‍රියාවලිය හඳුනා ගත යුතුය.ඒ අනුව ව්‍යාපෘතියට යන කාලය තීරණය කර එම මුළු කාලය සතිවලට හෝ මාස වලට බෙදා ගත යුතුය.ඒ අනුව කාල රාමුව "ගාන්ට්" [Gantt Chart] සටහනක් ඔස්සේ සකස් කර ගත යුතුය.

උදා-ඔබ පුස්තකාලයක් ගොඩ නැගීමේ ව්‍යාපෘතිය තෝරා ගත්තේ නම්,

| වයාපෘතියේ පියවර | ජනවාරි | | | | පෙබරවාරි | | | | මාර්තු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘතියේ මූලික කටයුතු | | | | | | | | | | | | |
| යෝජනාව සාකච්ඡා කිරීම | | | | | | | | | | | | |
| සැලැස්මක් සකස ්කිරීම | | | | | | | | | | | | |
| යෝජනාව අනුමත කර ගැනීම | | | | | | | | | | | | |
| උචිත ස්ථානය තෝරා ගැනීම | | | | | | | | | | | | |
| අවශ්‍ය උපකරණ සපයා ගැනීම | | | | | | | | | | | | |
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | | | | | | | | |
| තෝරා ගත් ක්‍රම ක්‍රියාත්මක කිරීම | | | | | | | | | | | | |
| ඉදිරියට පවත්වා ගැනීමේ වැඩපිළිවෙළ | | | | | | | | | | | | |
| ප්‍රගති සමාලෝචනය | | | | | | | | | | | | |

## 5 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

මෙය ඉතා වැදගත් බැවින් ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ සටහනක් පිළියෙළ කළ යුතුය. ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීමට නම් ඔබ එය මැනවින් සැලසුම් කළ යුතුය. ඉන් පසුව ඔබ එය සාර්ථකව ක්‍රියාත්මක කළහොත් පමණි සාර්ථක නිමැවුමක් නැතහොත් සාර්ථක ප්‍රතිඵලයක් ලැබෙන්නේ.




ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රමිතීන් ගැන අවධානය යොමු කළ යුතුය. ආරම්භයේදී සඳහන් කළ පරිදි ව්‍යාපෘතියක ප්‍රමිතීන් 3 කි.

1. කාලය [Time]
2. පිරිවැය [Cost]
3. ගුණය [Quality]

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී මෙම ප්‍රමිතීන් 3 ආරක්ෂා කළයුතුය.**

### 6 ව්‍යාපෘතිය ඇගයීම

**ව්‍යාපෘති ක්‍රියාවලියේ අවසාන අදියරට ඔබ දැන් පැමිණ ඇත.**




**ව්‍යාපෘතිය ඇගයීම මෙන්ම නියාමනය කිරීම ඉතාම වැදගත්ය. නියාමනය යනු ව්‍යාපෘතිය නිවැරදි මාර්ගයක ගමන් කරවීමට අවශ්‍ය උපදෙස් සැපයීමයි. ඇගයීම යනු ව්‍යාපෘතිය ආරම්භයේදී තබා ගත් අරමුණු ව්‍යාපෘතිය අවසානයේ දී ඉටු වීද යන්න සොයා බැලීමයි.**

**ඔබ විසින් ව්‍යාපෘතිය ඇගයීමට ලක් කළයුත්තේ ඇයි?**

- **අරමුණ ඉටුවීදැයි බැලීමට**
- **අනාගතය සඳහා පාඩම් ඉගෙන ගැනීමට**
- **දුබලතා ප්‍රබලතා හඳුනා ගැනීමට**
- **ව්‍යාපෘතියේ පිරිවැය /ප්‍රතිලාභ පිළිබඳ විග්‍රහයක් සඳහා**
- **අසාර්ථක වීමට හේතු දැන ගැනීම සඳහා**

**ඇගයීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ ආදි ක්‍රම භාවිතා කළ හැක. ව්‍යාපෘතිය ආරම්භයේදී ව්‍යාපෘති යෝජනාවද අවසානයේදි ව්‍යාපෘති වාර්තාව [Final Report] සකස් කිරීම අවශ්‍යය.**

## 2-8 ව්‍යාපෘති යෝජනාවක් සකසමු

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

පිටු අංක 1

# ව්‍යාපෘති යෝජනාව

පාසලේ නම :

කොට්ඨාසය :

ව්‍යාපෘති නාමය :

ව්‍යාපෘති අංකය :

අනුමත මුදල :

සාධාරණීකරණය :

ප්‍රතිලාභීන් හා ඔවුනට ලැබන ප්‍රතිලාභ :

වාර්ෂික ඉලක්ක :

ව්‍යාපෘති අරමුණු

1

2

3

ව්‍යාපෘති යෝජනාව
ඉදිරිපත් කරමි
………………
ගුරුභවතා

ව්‍යාපෘති යෝජනාව
නිර්දේශ කරමි
……………….
නි.විදුහල්පති

ව්‍යාපෘති යෝජනාව
අනුමත කරමි
..………………..
විදුහල්පති

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**පිටු අංක 02**

# ව්‍යාපෘති සැලැස්ම

ව්‍යාපෘතියේ නම
ව්‍යාපෘති අංකය
ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තු මුදල

| ව්‍යාපෘති ක්‍රියාකාරකම | ව්‍යාපෘති උප ක්‍රියාකාරකම් | කාලරාමුව | වගකීම දරණ අය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | පිරිවැය | කාර්ය සාධන දර්ශකය | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| | | J F M A | | | | | |
| | | | | | | | |

මුළු පිරිවැය

| | | |
|---|---|---|
| ව්‍යාපෘති යෝජනාව | ව්‍යාපෘති යෝජනාව | ව්‍යාපෘති යෝජනාව |
| ඉදිරිපත් කරමි | නිර්දේශ කරමි | අනුමත කරමි |
| ……………. | ……………. | ……………. |
| ගුරුභවතා | නියෝජ්‍ය විදුහල්පති | විදුහල්පති |

## 2-9 ව්‍යාපෘති වාර්තාව සකසමු

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ව්‍යාපෘති වාර්තාව ගොනු කළ යුතු ආකාරය**

1 ආරම්භක පිටු

2 සාරාංශය

3 ව්‍යාපෘති හැඳින්වීම

4 අරමුණු

5 ප්‍රතිලාභ ලබන්නන් පිළිබඳ විස්තර

6 ව්‍යාපෘතිය සඳහා යොදා ගත් සම්පත්

7 භාවිතා කළ ක්‍රමවේදය

8 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ආකාරය

9 කාල රාමුව

10 දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය

11 නිගමන යෝජනා සොයාගැනීම් හා ප්‍රතිඵල

12 ස්වයං ඇගයීම/සාකච්ඡා

13 ආශ්‍රිත ග්‍රන්ථ

14 ඇමුණුම

## 2-10 ව්‍යාපෘති හා විෂය සමගාමී ක්‍රියාකාරකම් අතර සබඳතාව

ව්‍යාපෘතින් හා විෂය සමගාමී ක්‍රියාකාරකම් අතර සබඳතාවක් තිබේද? ඔබට කුමක් සිතෙන්නේද?

බැලූ බැල්මට ව්‍යාපෘතියක 'එ' 'ඒ විෂයන්ට සමගාමීව දියත් කළ හැක.

උද-බිත්ති පුවත්පත්-සිංහල විෂය

චිත්‍ර ප්‍රදර්ශනය -චිත්‍ර විෂය.


ආගමික වැඩසටහන්-ආගම

එසේ නම් ව්‍යාපෘතියක් යනු විෂය සමගාමී ක්‍රියාකාරකමකි. නමුත් මේ දෙක අතර පැහැදිලි වෙනසක්ද නැත්තා නොවේ.ව්‍යාපෘතියක් සිදු කරන්නේ යම් කිසි ගැටලුවකට විසඳුමක් ලබා ගැනීමේ අරමුණින්ය. නමුත් විෂය සමගාමී ක්‍රියාකාරකම් එසේ නොවේ. දරුවන්ගේ පෞරුෂ්‍ය සංවර්ධනය කිරීම අරමුණු කර ගෙන ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘති සැලසුමක් ලියා කළමනාකාරීත්වය තුළින් අනුමත කරවා ගෙන අවසාන ඵලය ව්‍යාපෘති වාර්තාවක් ලෙස එළිදැක් විය යුතුය. නමුත් විෂය සමගාමී ක්‍රියාකාරකම් මේ ආකාර වූ දීර්ඝකාලීන වැඩපිළිවෙළකට යටත් නොවී ක්‍රියාත්මක කළ හැක.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සමානද? අසමානද?



PROJECTS

**ආශ්‍රිත ග්‍රන්ථ**


1 විෂය සමගාමී ක්‍රියාකාරකම් හා පාසල් ව්‍යාපෘති මොඩියුලය

2 කුලරත්න ඩබ්.ජී.-2000-ව්‍යාපෘති සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම හා ඇගයීම අත්පොත

3 අටුගොඩ සුනිල්-1998-ව්‍යාපෘති කළමනාකරණය

4 ගුණසේකර සමරසිංහ-1998-ව්‍යාපෘති සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම හා ඇගයීම